(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 391.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2014 සැප්තැම්බර් මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2581/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු පළාතේ විදුලිය නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

යන්න දිස්ත්‍රික්ක මට්ටමින්, වෙන් වෙන් වශයෙන් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගම්මානවලට කවර කාල සීමාවක් තුළදී විදුලිය ලබාදීමට කටයුතු කරන්නේද;

(ii) 2012 වර්ෂය තුළදී උතුරු පළාතේ එකී සියලු ගම්මානවලට විදුලිය ලබාදීමේ හැකියාවක් තිබුණේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3240/'12

2.

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාළව,

(i) 2012 වර්ෂයේ සිට අද දක්වා ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(ii) 2015 - 2016 වර්ෂ සඳහා අපේක්ෂිත ලාභය හෝ අලාභය කොපමණද;

(iii) අද වන විට පවතින ප්‍රාග්ධන ප්‍රමාණය සහ සංචිත ප්‍රමාණය කොපමණද;

(iv) එම ආයතනයේ සේවය කරන පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(v) එහි සේවක අතිරික්තයක් හෝ සේවක හිඟයක් තිබේද;

(vi) එම ආයතනය සේවකයෙකු වෙනුවෙන් දරන වියදම සහ සේවකයෙකුගෙන් ලබන ලාභය කොපමණද;

(vii) කෙටි කාලීන ණය, බැංකු අයිරා, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ණය යනාදියෙහි මේ වන විට පවතින මුළු එකතුව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3688/’13

3\.
ගරු අනුර දිසානායක මහතා,— සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2011 සහ 2012 වර්ෂ දෙකම සඳහා පැවැත්වූයේ එක් රාජ්‍ය නාට්‍ය උළෙලක් බවත්;

(ii) වාර්ෂිකව පැවැත්විය යුතු එම උළෙල ඉහත සඳහන් පරිදි වර්ෂ දෙකකට වරක් පැවැත්වීමට හේතුව මුදල් නොමැතිකම බවත්;

යන්න එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත පරිදි පැවැත්වූ රාජ්‍ය නාට්‍ය උළෙල සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් වියදම් කළ ආකාරයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය අනුග්‍රහය මත නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහලේ පැවැත්වූ “මහ සමයම” ප්‍රසංගයට වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් ලැබුණු ආකාරය කවරේද;

(iii) එම ප්‍රසංගයේ එක් එක් කටයුතු වෙනුවෙන් එම මුදල් වියදම් කළ ආකාරය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3919/’13

4\.
ගරු බුද්ධික පතිරණ මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අඹ, කෙසෙල්, ගස්ලබු වැනි පළතුරු කල්තබා ගැනීමට සහ ඉක්මනින් ඉදවීමට ඇතැම් ව්‍යාපාරිකයින් විවිධ රසායනික ද්‍රව්‍ය භාවිතා කරන බව පිළිගන්නේද;

(ii) එලෙස භාවිතා කරනු ලබන ද්‍රව්‍යවල රසායන විද්‍යාත්මක නාම හා වෙළඳ නාම කවරේද;

(iii) එම රසායනික ද්‍රව්‍ය අතරින් මිනිස් සිරුරට අහිතකර ද්‍රව්‍ය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළතුරු ඉදවීමට සහ කල්තබා ගැනීමට මිනිස් සිරුරට අහිතකර රසායනික ද්‍රව්‍ය යොදා ගන්නා ව්‍යාපාරිකයින් නීතියේ රැහැනට හසුකර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) 2011 සහ 2012 වර්ෂවල නීතියේ රැහැනට හසුකර ගන්නා ලද එවැනි ව්‍යාපාරිකයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් අතරින් දඬුවම් ලබා දී ඇති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4164/'13

5\.

ගරු පී. හැරිසන් මහතා,— දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින ආයුර්වේද වෛද්‍යවරුන්ගේ කාණ්ඩවල නම් කවරේද;

(ii) එම එක් එක් කාණ්ඩයට අයත් වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාණ්ඩ අතර සිටින සර්වාංග විශේෂඥ වෛද්‍යවරුන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2005 වර්ෂයේ සිට 2013 දක්වා කාල සීමාව තුළ ආයුර්වේද දෙපාර්තමේන්තුව මගින් බලපත්‍ර ලබාදී ඇති සමස්ත සම්බාහන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, ඒවායේ ලිපිනයන් සමග දිස්ත්‍රික්ක මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාමට අවසර ලබාදී ඇති වෛද්‍යවරුන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iv) ආයුර්වේද දෙපාර්තමේන්තුවට අමතරව වෙනත් ආයතන මගින් සම්බාහන මධ්‍යස්ථාන පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ලබාදී තිබේ නම්, එම ආයතනවල නම් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම සඳහා තිබිය යුතු අවම වෘත්තීය සුදුසුකම් කවරේද;

(ii) එවැනි මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන ස්ථානයක තිබිය යුතු තත්ත්වයන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4506/'13

6\.

ගරු සුජීව සේනසිංහ මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා දහයක් මිලදී ගැනීමේ සැලසුමක් ඇති බව දන්නේද;

(ii) මිලදී ගැනීමට අපේක්ෂිත එම ගුවන් යානා සඳහා වැය කිරීමට නියමිත මුදල කොපමණද;

(iii) එම ගුවන් යානා මිලදී ගන්නේ කුමන රටකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම සහ සීමාසහිත මිහින් ලංකා (පෞද්ගලික) ගුවන් සමාගම 2013 ජනවාරි සිට මේ දක්වා ලැබූ පාඩුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අධික පාඩු ලබමින් පවත්වාගෙන යනු ලබන ශ්‍රී ලංකන් ගුවන් සමාගම සඳහා අලුතෙන් ගුවන් යානා මිලදී ගැනීමට ප්‍රතිපාදන සපයා ගනු ලබන ආකාරය කවරේද;

(iii) එම නව ගුවන් යානා මිලදී ගැනීම අනුමත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4588/'13

7.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) සූදු බඳු සහ අනෙකුත් ආශ්‍රිත බඳු ගෙවීම පිණිස ''මරීනා කලම්බු'' හෝ වෙනත් සමාන නමකින් ''කැසිනෝ'' ආයතනයක් ලියාපදිංචි කොට තිබේද;

(ii) එම ආයතනය පළමු වරට ලියාපදිංචි කොට තිබෙන්නේ කවදාද;

(iii) ඉහත කී කැසිනෝ ආයතනය ලියාපදිංචි කොට තිබෙන්නේ කවර නාමයක් (පුද්ගලයකු හෝ සමාගමක්) යටතේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4590/'13

8.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා පෙර පාසල් පිළිබඳව පවත්වා ගෙන යනු ලබන ලේඛනයක් අමාත්‍යාංශයේ තිබේද;

(ii) ඒ අනුව දැනට ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන හා පෙර පාසල් සංඛ්‍යාව දිස්ත්‍රික් අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම සියලු ආයතන මධ්‍යම රජයේ හෝ පළාත් සභා යටතේ ලියාපදිංචි කර තිබේද;

(iv) පෙර පාසල් ලියාපදිංචි කිරීමේදී යොදා ගන්නා නිර්ණායක කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ගුරුවරුන්ට සහ පාලිකාවන්ට තිබිය යුතු බවට අමාත්‍යාංශය මගින් පිළිගත් අවම සුදුසුකම් කවරේද;

(ii) එකී පාලිකාවන් සහ ගුරුවරුන් විසින් නියමිත සුදුසුකම් සපුරා තිබේද;

(iii) පෙර පාසල් හා පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීමට හා ඒවා විධිමත් කිරීමට රජය ගෙන යන වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4741/'14

9.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) දිවයිනේ ඇති පාසල් අතරින් 6 වැනි ශ්‍රේණියේ සිට උසස් පෙළ දක්වා සෞන්දර්යය විෂයයන් උගන්වනු ලබන පාසල් කවරේද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඇති එවැනි පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පාසල්වල සේවයේ නියුතු සංගීත, නැටුම්, චිත්‍ර හා නාට්‍ය හා රංග කලාව යන සෞන්දර්යය විෂයයන් උගන්වනු ලබන ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) එම දිස්ත්‍රික්කයේ ඇති සෞන්දර්යය ගුරු අවශ්‍යතාව ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4871/'14

10.

ගරු තිස්ස අත්තනායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) නොරොච්චෝල තාප බලාගාරයේ බිඳ වැටීම් සහ නඩත්තු කටයුතු හේතුවෙන් නිෂ්පාදන කටයුතු නවතා දැමීම නිසා ජාතික විදුලිබල පද්ධතියට මේ දක්වා අහිමි වූ විදුලි ධාරිතාවය කොපමණද යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2014 පෙබරවාරි 13 වැනි දින නොරොච්චෝල තාප බලාගාරයේ කන්ඩෙන්සර් පද්ධතියට ලුණු හෝ ඒ හා සමාන කිසියම් රසායනික ද්‍රව්‍යයක් එකතු කර ඇති බවට ඉදිරිපත් වූ ප්‍රකාශයෙහි සත්‍යතාවයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව මේ වන විට සිදු කර ඇති පරීක්ෂණ කවරේද;

(iii) ඒ සම්බන්ධයෙන් වරදකරුවන් වූ පුද්ගලයෝ කවුරුන්ද;

(iv) ඔවුන් සම්බන්ධයෙන් ගනු ලැබූ නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4945/'14

11.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මොණරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එවකට ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයට අයත්ව තිබූ "බදුලුවෙල රක්ෂිතයේ" වර්ෂ 50 - 60ක් පමණ පැරණි තේක්ක වගාවක් ඇති බවත්;

(ii) කිසියම් පුද්ගලයෙකු කූඨ ලිපි ලේඛන සකසා එම ඉඩම පෞද්ගලික සින්නක්කර ඉඩමක් ලෙස භුක්ති විඳින බවත්;

(iii) පුද්ගලයන් කිහිප දෙනෙකු රජයට අයත් එම තේක්ක වගාව විනාශ කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වර්ෂ ගණනාවක් ආරක්ෂිතව තිබූ බදුලුවෙල රක්ෂිතයේ තේක්ක වනය අනවසර පදිංචිකරුවන්ගෙන් රැක ගැනීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ගයක් ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4962/'14

12.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පසුගිය වර්ෂය තුළ පොහොර සහනාධාරය ලබා දුන් ගොවීන් සංඛ්‍යාව එක් එක් බෝග වර්ගය අනුව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොහොර සහනාධාර ක්‍රමය යටතේ පසුගිය වර්ෂයේ සිට ලබා දුන් රු.350.00ක පොහොර බෑගයක් සඳහා රු.150.00ක අමතර මුදලක් රක්ෂණාවරණයක් වශයෙන් අය කර ගත් බව එතුමා දන්නේද;

(ii) එසේ නම්, සහනාධාර යටතේ ලබා දෙන එක් පොහොර බෑගයක් වෙනුවෙන් රු.150.00ක මුදලක් අමතරව අය කර ගනිමින් ආරම්භ කළ රක්ෂණාවරණයේ පදනම කවරේද;

(iii) එම රක්ෂණාවරණය ආරම්භ කළ දින සිට මේ දක්වා ගොවීන්ගෙන් අය කර ගෙන ඇති මුළු මුදල කොපමණද;

(iv) එකී රක්ෂණාවරණය යටතේ හිමිකම් ඉල්ලීම සඳහා සපුරාලිය යුතු කොන්දේසි කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5167/'14

13.

ගරු ජෝන් අමරතුංග මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 179 ඇලපිටිවල ග්‍රාම නිලධාරී වසමේ, නවම්මහර ග්‍රාමයේ ඇති රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචිව සිටින පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම අනවසර පදිංචිකරුවන්ගේ පවුල්වල ගෘහ මූලිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත පවුල් අතරින් පවුල් වැඩි සංඛ්‍යාවක් වසර 20කට වැඩි කාලයක් ඉහත ග්‍රාමයෙහි පදිංචිව සිටියද, මෙතෙක් ඔවුන්ගේ ඉඩම් වෙනුවෙන් ස්ථිර ඔප්පුවක් හෝ තාවකාලික බලපත්‍රයක් හෝ ලබා දීමට කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) එම පිරිස පදිංචි ඉඩම් සඳහා ස්ථිර ඔප්පු ලබා දෙන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

(iv) ස්ථිර ඔප්පු ලබා දෙන තෙක් තාවකාලික බලපත්‍ර ලබා දෙන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5359/'14

14\.
ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පලාලි ගුවන් තොටුපළේ ඉදිකිරීම් කටයුතු අවසන් කරනු ලබන දිනය කවරේද;

(ii) එය මහජනතාව සඳහා විවෘත කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2732/'12

15\.
ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගල්ගමුව මහවැවෙන් ජලය සපයනු ලබන කුඹුරු අක්කර සංඛ්‍යාව කොපමණද;

(ii) මෙම වැවෙන් යැපෙන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අක්කර 20ක් පමණ වන ගල්ගමුව වැවෙහි අක්කර 18 ක පමණ ප්‍රදේශයක් මේ වන විට වැලි හා පස්වලින් පිරී ඇති බවත්;

(ii) කන්න දෙකම වගා කිරීමට තරම් ප්‍රමාණවත් ජලය රැස්කළ හැකිව තිබූ මෙම වැව යටතේ මේ වන විට එක් කන්නයක්වත් වගා කළ නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් වැවෙහි ජලය ප්‍රයෝජනයට ගෙන ගොවිතැන් කටයුතු කරන ජනතාව වෙනුවෙන් පස් හා රොන් මඩ ඉවත්කර එම වැව ප්‍රතිසංස්කරණය කර දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුළු මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.
කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*3.

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

මහනගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

නගර සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ප්‍රාදේශීය සභා (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*15.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*18.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනත යටතේ නියෝග,—2013 අංක 33 දරන ක්‍රීඩාවල යෙදීමේදී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති පනතේ 3 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 34 වැනි වගන්තිය යටතේ

ක්‍රීඩා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 19 දිනැති අංක 1863/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.08.19 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*20.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*21.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*22.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*23.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*27.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*28.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*29.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*30.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*31.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*32.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණ පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

33.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

34.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

35.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

37.

ජයන්තිපුර සුභසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

මෙත් සේවා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

39.

ශ්‍රී ලංකා කෘෂිකර්ම ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

40.

ජයරත්න පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

41.

ජම් ඉය්යතුස් සහ්වා අල් - හයිරිය්යා (ජස්කා) (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

42.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

43.

අනුර විදානගමගේ ප්‍රජා සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

44.

අල්හසන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

45.

දහම් පාසල් ගුරු අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---